254
කැලණිය විශ්වවිද්‍යාලය
29 FEB 2000

# කැලණිය විශ්ව විද්‍යාලය

## වාරිමාර්ග කළමණාකරණයේ ලා ගොවි සංවිධාන වල කාර්ය භාරය

(පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරිය ව්‍යාපාරය ආශ්‍රයෙන්)

ප්‍රවේශ අංකය 254
වර්ග අංකය

GEOG / M / 03 / R / 97

භූගෝල විද්‍යා අධ්‍යයන අංශය

කැලණිය විශ්ව. විද්‍යාලයේ සමාජ්‍ය විද්‍යාපති (භූගෝල විද්‍යා)

පාඨමාලා පර්යේෂණයෙහි අධ්‍යයන අවශ්‍යතාවයක් පරිපූර්ණ කිරීම සඳහා

ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධිකාවකි.

1998 ජුලි

## සාරාංශය

වාරිමාර්ග කළමනාකරනය පිළිබඳ අදහස විකාශය වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගවල සිටය. එදා පැවති වාරි ශිෂ්ඨාචාරය අද වන විට ද ලෝකයේ වැදගත් තැනක් උසුලයි. ශ්‍රී ලංකාවේ මල්වතු ඔය මිටියාවතෙන් ආරම්භ වන වාරි ශිෂ්ඨාචාරය ඉතා වේගවත් හා සංකීර්ණ පරිවර්තනයකට භාජනය වී ඇත. මෙම පරිවර්තනය ප්‍රධාන වශයෙන් පුරාතන, මධ්‍යතන හා නූතන යුගය යනාදි වශයෙන් යුග තුනකට බෙදා සාකච්ඡා කළ හැකිය. මල්වතු ඔය මිටියාවතින් ඇරඹී වාරි ශිෂ්ඨාචාරයේ සිට ඉන්දීය ආක්‍රමණ දක්වා "යුගය පුරාතන" යුගය වශයෙන් හැඳින්විය හැකිය. "මධ්‍යතන යුගය" වශයෙන් සැලකෙන්නේ විදේශ ආක්‍රමණ වලින් පසුව ශ්‍රී ලංකාව නිදහස ලබන තුරු කාල පරිච්ඡේදයයි. "නූතන යුගය" ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය කර සංවර්ධනය වූ කාල පරිච්ඡේදයේ සිට අද දක්වා වකවානුවයි.

වාරිමාර්ග කළමනාකරණයට ප්‍රතිලාභීන් සහභාගි කර ගැනීමේ අදහස අවධානයට යොමු වන්නේ 1960 ගනන් වලින් පසුවයි. ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු ඇතිවූ ගෙවුම් ශේෂ දුෂ්කරතාවන් මඟ හැර ගැනීමටත්, අයවැය හිඟය පියවා ගැනීමටත්, රාජ්‍ය වියදම් අවම කිරීමේ ක්‍රමෝපායන් විදේශ අධාර කණ්ඩායම් විසින් යෝජනා කරන ලදී. මේ යෝජනා අතර ප්‍රධාන වූයේ වාරිමාර්ග පද්ධතියේ නඩත්තුවට ප්‍රතිලාභීන් හවුල් කර ගැනීම, විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම ඉදිකිරීම වෙනුවට පවතින යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය, හා භෝග විවිධාංගීකරණයයි. ශ්‍රී ලංකා රජයට මෙම යෝජනා ගෙන ඒමට මුල් වුනේ එක්සත් ජාතීන්ගේ ආහාර සංවිධානයේ පෙප්සැක් (PEPERSAC) දූත කණ්ඩායමයි. මෙහිදී ප්‍රතිලාභීන් හවුල් කර ගැනීම එදා මහා පරාක්‍රමබාහු රාජ සමයේ යොදාගත් ආකාරයට ඉටු කිරීමට නිර්දේශ විය.

ජල කළමනාකරණය අරමුණු කර ගනිමින් 1980 ගල් ඔය ආරම්භ කළ "ගොවි සංවිධාන වැඩසටහන" ප්‍රතිලාභීන් පාලනයට හවුල් කර ගැනීම සඳහා දියත් කළ වැඩ සටහන් අතර සුවිශේෂ වූ වැඩ සටහනක් විය. මෙම වැඩ සටහන දියත් කළේ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගිනි. මෙම වැඩසටහනෙන් ලැබූ අත් දැකීම් පදනම් කරගෙන 1984 වන විට ශ්‍රී ලංකාවේ මහා වාරි මාර්ග ව්‍යාපාර 34 ක "ඒකාබද්ධ වාරි මාර්ග කළමනාකරණ වැඩ සටහන" දියත් කරන්නට යෙදුනි. මෙම වැඩසටහන දැනට වසර ගණනක් තුළ අඛණ්ඩව මහා වාරිමාර්ග ව්‍යාපාර තුළ ක්‍රියාත්මක වේ.

මෙම අධ්‍යනයේ ප්‍රධාන අපේක්ෂාව වූයේ වාරිමාර්ග කළමනාකරණයට ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩ සටහන කොතෙක් දුරට දායක වී ඇත්ද යන්න සොයා බැලීමයි. ඒ සමගම රාජ්‍ය වියදම් අවම කිරීමට මෙම වැඩසටහනෙන් යම් පිටුබලයක් ලැබී ඇත්ද යන්න සොයා බැලීමයි. තවද මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරගෙන යාමේදී මුහුණදුන් බාධක - දුර්වලතාවන් ශක්තීන් පිළිබඳව අධ්‍යයනය කිරීම ද මෙම අධ්‍යනයෙන් අපේක්ෂා කෙරිනි. ඒ හැරුණු විට අනාගතයේ මෙම ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයන කටයුතු වල නියැලෙන්නන්ට මූලික මඟ පෙන්වීමක් මේ මගින් කැරුණු ඇත. මේ නයින් අනාගතයේ වාරිමාර්ග කළමනාකරණය හා ජල සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් වඩාත් ඵලදායි අධ්‍යනය සඳහා පසුබිම සැකසීමද මෙයින් සිදුවනු ඇතැයි අපි අපේක්ෂා කරමු. විශේෂයෙන්ම වාරි මාර්ග කළමනාකරණය සම්බන්ධයෙන් දකුණු ආසියාතික රටවල ක්‍රියාත්මක වන සමකාලීන වැඩසටහන් පිළිබඳ සංසන්ධනාත්මක විග්‍රහයක් මෙහි අන්තර්ගත ය. එනම් එම වැඩ සටහන් හා ශ්‍රී ලංකාවේ ඉන්මාස්(INMAS) වැඩ සටහන අතර තුලනාත්මක විග්‍රහයක් මෙයින් ඉදිරිපත් කොට තිබේ.

මෙම අධ්‍යනය සඳහා දත්ත තොරතුරු සපයා ගැනීමට විධික්‍රම කිපයක් අනුගමනය කරනු ලැබීය. අධ්‍යනයට භාජනය වූ මින්නේරිය ව්‍යාපාරයේ අතීත තොරතුරු අදාල වූ ග්‍රන්ථ පරිශීලනයෙන් සපයා ගන්නා ලදි. තවද ව්‍යාපාරය

ආරම්භයේ සිට ප්‍රදේශයේ පදිංචිව සිටි පැරණි ගොවිමහතුන් හමුවී ඔවුන් සමග සාකච්ඡා කර ලබා ගත් තොරතුරු ද අධ්‍යනය සඳහා පදනම් කරගෙන ඇත. එමෙන්ම මේ පිළිබඳව විවිධ දේශීය විදේශීය දේශන සම්මන්ත්‍රණ හා වාර්තා පරිශීලනය කිරීමෙන් ලබා ගත් තොරතුරු මෙම නිබන්ධය සැකසීමේදී වැදගත් විය. මෙම අධ්‍යනය සඳහා සුවිශේෂ පරීක්ෂාවකට තෝරා ගන්නා ලද්දේ මින්නේරිය ව්‍යාපාරයයි. එහි ක්‍රියාත්මක ගොවි සංවිධාන හා එම සංවිධාන වලට අයත් ගොවීන්ගේ අහඹු නියැදියක් අධ්‍යනය සඳහා යොදා ගන්නා ලදි.

වාරිමාර්ග පද්ධතිය කළමනාකරණය සඳහා ගොවි සංවිධාන වලින් මහඟු දායකත්වයක් ලබා දී ඇත. ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩ සටහන යටතේ මහා වාරිමාර්ග පද්ධතියේ බෙදුම් ඇළෙන් පහළ ප්‍රදේශය මුලුමනින්ම පාලනය කිරීම, මෙහෙයුම් හා නඩත්තු කිරීම ගොවි සංවිධාන විසින් ඉටුකරයි. මෙම කටයුතු සඳහා සංවිධාන අරමුදල් වැය කෙරේ. පද්ධතියේ ඉදිකිරීම් සංවිධාන මගින් ඉටුකෙරේ. මීට අමතරව යෙදවුම් සැපයීම, ගොවීනට ණය සැපයීම, නිෂ්පාදන අලෙවිය, පුහුණු වැඩ සටහන් සංවිධානය, ශ්‍රමදාන සංවිධානය, වැඩමුලු සංවිධානය හා පැවැත්වීම, නීතිමය කටයුතු සඳහා දායක වීම, ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම සඳහා වන වැඩසටහන් වලට ගොවීන් යොමු කිරීම, ගොවීන්ගේ ගැටළු විසඳීම සඳහා මැදිහත් වීම, යන සේවාවන් රැසක් ගොවි සංවිධාන සහභාගීත්වයෙන් ඉටු වේ. ඉහතින් සඳහන් කළ වැඩසටහන් වලදී ප්‍රතිලාභීන් ඍජුවම ගොවි සංවිධන මගින් හවුල් වී ඇති අතර මෙය රාජ්‍ය අංශයට විශාල පහසුවක් වී ඇත. වාරිමාර්ග කළමනාකරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩ සටහන වඩා ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් විය හැකි නිගමන හා යෝජනා මෙහිදී හඳුනා ගන්නා ලදි. ඒ මෙසේය.

අධ්‍යනයෙන් එළඹිය හැකි ප්‍රධානතම නිගමනය ලෙස සඳහන් කළ හැකි වන්නේ රාජ්‍ය වියදම් අවම කිරීම සඳහා මහා වාරිමාර්ග ව්‍යාපාර වල ප්‍රතිලාභීන් හවුල්කර ගැනීමේ අපේක්ෂාව බොහෝදුරට සාර්ථක වී ඇති බවයි. තව දුරටත්

මෙම රාජ්‍ය වියදම් අවම කිරීමට නම් පවතින පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කළ යුතුය. මේ යටතේ කෙත් ඇල, බෙදුම් ඇල පමණක් නොව ප්‍රධාන ඇල හා සියළුම අතු ඇලවල් වල පාලනය, මෙහෙයුම, නඩත්තුව ගොවි සංවිධාන වලට පැවරීමට අවශ්‍යතා මෙන්ම ඉඩප්‍රස්තා ද පවතී. මේ සඳහා ප්‍රතිලාභීන් හවුල් කර ගැනීමට යොදා ගනු ලබන ප්‍රධාන වාහකයා වන ගොවි සංවිධාන ක්‍රියා කාරීත්වයේ අඩු ලුහුඬු කම් නැතුවා නොවේ. මෙම තත්වයන් මග හැර ගැනීම සඳහා වැදගත් විය හැකි යෝජනා රැසක් ඉදිරිපත් කිරීමට මෙම අධ්‍යනය අවස්තාවක් කර ගන්නා ලදි. එම යෝජනා අතර ප්‍රතිලාභීන් හවුල් කර ගැනීමට බෙහෙවින් බලපාන ආයතනික සංවර්ධන කටයුතු වල විධිමත් ක්‍රියාකාරීත්වයක් අවශ්‍යය. ස්වෙච්ඡා සංවිධාන ක්‍රියාකාරීත්වය බොහෝ දුරට සාර්ථක වුවත් ඒවායේ මෙහෙයුම් බලවේගය වන ආයතනික සහභාගීත්වය නිසි අයුරින් නොයෙදෙන බව මෙහිදී තහවුරු වේ. කෙත් ඇල හා බෙදුම් ඇල ගොවි සංවිධාන වල ක්‍රියාකාරීත්වය විධිමත් සැලසුමකට අනුව ක්‍රියාත්මක විය යුතුය. තවද මෙම සංවිධාන වලින් වාරිමාර්ග පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුව විධිමත් පරිදි නිරසර සැලසුමකට අනුව ක්‍රියාත්මක විය යුතුය. එමෙන්ම ගොවි සංවිධාන ක්‍රියාකාරීත්වය ප්‍රතිලාභීන්ගේ විශ්වාසය ගොඩ නැගෙන අයුරින් විනිවිද භාවයෙන් යුක්ත නොවීමේ දුර්වල ක්‍රම සාමාන්‍ය අත්දැකීමක් සේ ගත හැකිය. මහා වාරි මාර්ග ව්‍යාපාර වල මෙම වැඩ සටහන නිසා රාජ්‍ය වියදම් තව දුරටත් අවම කර ගත හැකිය. ඒ සඳහා පරිපාලනමය වෙනස් කම් ඇති කළ යුතුවේ. ඊට අදාල යෝජනා අධ්‍යනයෙන් පෙන්වා දෙනු ලැබ තිබේ එවැනි වූ ක්‍රියාමාර්ග තුලින් ශ්‍රී ලංකාවේ ජල සම්පත් කළමනාකරණය වඩාත් ඵලදායි කිරීමේ හැකියාවක් පවතී.

22-11-2003